විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව



# සිහිනයක් වගේ... 18

"මිස්.. සාප්පු සවාරියේ යනවා වගේ..?" ඒ ප්‍රශ්නය ඇයට ඇසුණේ දෑතින් එල්ලාගත් ඇඳුම් බෑග් දෙකත් අතැතිව පඩි පෙළ බසිමින් සිටියදී ය.

ස්නේහා තමා එන තෙක් පඩිපෙළ පාමුළ සිට බලා සිටි දොස්තර මේනක සිරිමාන්න ඉදිරියේ නැවතුණා ය.

"සර් මේ වෙලාවෙ..?" ඈ ඇසුවා ය. ඔහු සාමාන්‍යයෙන් මග තොටේදී හමුවන්නට හැකි අයෙකු නොවන බව ඈ දැන සිටියා ය. සාමාන්‍යයෙන් ඔහු සෑම හවසකම චැනල් සේවයට යන බවත් එය අවසන් වීමෙන් පසු නැවතත් රෝහල් වල සිටින ඔහුගේ ලෙඩුන් බැලීමට යන බවත් මේ සියල්ල අවසන් වන්නේ රෑ දහය පමණ වන විට බවත් ස්නේහා පසුගිය කාලය පුරාම නිරීක්ෂණය කර තිබුණි.

"අද මං නිවාඩුවක් ගත්තා ස්නේහා... හවස් වෙද්දි මහන්සියක් වගේ දැනුණා.. ටිකක් වෙනසකටත් එක්ක නුගේගොඩින් බැස්සෙ.. මං හිතුවෙ නෑ ඔයා මෙතෙනදි හමුවෙයි කියලා" ඔහු කීවේ ය. ".. මං කියන්නද..? ස්නේහාට පමා වෙන්නෙ නැත්නම් අපි මොනවා හරි බොන ගමන් කතා කරමුද..?"

නවාතැනට පමා වී යන්නට ස්නේහා අකැමැති ය. එහෙත් මේනක ගේ විනීත යෝජනාව ප්‍රතික්ෂෙප කරන්නට නොහැකි බවත් ස්නේහාට දැනෙයි. ඉල්ලීම ප්‍රතික්ෂෙප කර ඔහුගේ සිත රිදවන්නට ඇයට නොසිතෙයි. ඇය හිස වනා එකඟතාව පළකරන්නේ එනිසා ය.

මේනකගේ සැප වාහනයේ ඉදිරි අසුණ ස්නේහාට දැනුණේ නුහුරු තැනක් සේ ය. ඇය ඉදිරියේ ඩෑෂ් බෝඩයේ මැද තිබූ කුඩා වීඩියෝ තිරය මත අමරදේව සූරීන්ගේ රුව දර්ශනය වෙයි. පසුබිමින් වාදනය වන්නේ ඔහුගේ ගීයකි. තරමක් පැරණි වුව ද ඒ ගීයට ස්නේහා ද කැමතිය.

මළ ඉර බසිනා සැන්දෑ යාමේ ඔබගෙන් සමුගන්නම්

අඳුරට ඉඩ දී අඳුරේ සැඟවී ඔබගෙන් වෙන් වී මම යන්නම්

"සින්දුව ලස්සනයි" ස්නේහා කීවා ය.

ඔහු සිනාසී ගීයේ හඬ මඳක් වැඩි කළේ ය.

"මාත් ආසම සින්දුවක්.. ඒත් මං හිතුවෙ නෑ ඔයා කැමතිවෙයි කියල .. දැන් ළමයි ඕවට නෙවෙයිනෙ ආස.. එයාලට ඕනෙ හදවතට කියන සින්දු නෙවෙයි කකුල් වලට කියන සින්දුනෙ.." ඔහු කීවේ ය.

"ඇයි සර් ඒ සින්දුවට ආසී ඒක දුක හිතෙන සින්දුවක්නෙ" තමන් ඇසුවේ අනවශ්‍ය ප්‍රශ්නයක් යයි ස්නේහා සිතුවේ එය ඇසුවාට පසුව ය. දොස්තර මහත්තයාගේ කාරයේ යනවා මදිවාට ඔහුගෙන් අනවශ්‍ය ප්‍රශ්න අසන්නට තරම් හයියක් හෝ අයිතියක් තමන්ට තිබේදැයි ඈ තමාගෙන්ම අසා ගත්තා ය.

"අපි හැමෝගෙම ජීවිත වල හංගගත්ත දුක් වේදනා තියෙනවා ස්නේහා... මතු පිටින් නොපෙණුනාට අපි හැමෝම ඉන්නෙ එකම බෝට්ටුවෙ" ඔහු කීවේ ය.

"සර්ට ඕනෙ තරම් සල්ලි තියෙනවනෙ" ස්නේහා ගේ කතාවට මේනක මහ හඬින් සිනාසුණේ ය. ඔහු උත්තර දුන්නේ විනඩි ගණනාවක් සිනාසීමෙන් පසුව එක අතකින් ඇස්වල නැගුණ කඳුලු පිස දමමින් ය.

"සල්ලි තියෙන මිනිස්සුන්ට දුක් වේදනාවල් දැනෙන්නැහැ කියලද ස්නේහ හිතන්නෙ?"

"අනේ මන්ද සර්.. අපට නම් තියෙන ප්‍රශ්න වලින් සීයට අනූවක්ම විසඳගන්න පුලුවන් සල්ලි තියෙනවා නම්" ස්නේහා කීවා ය. ඇගේ අවංක කතාව මේනක සතුටට පත් කළේය. සමාජයේ වැඩි දෙනෙක් සිතන්නේ ඒ ආකාරයට බව ඔහු දනියි. මුදල මුළට ආ සමාජයක එය පුදුමයක් නොවේ.

"සල්ලි වලට විසඳන්න බැරි ප්‍රශ්න අනන්තවත් තියෙනවා ස්නේහා.. ඒක පැත්තක තියමු.. මං කතාවක් කියන්නද..? අමරදේව සර්ගෙ සින්දු වලට ආස ළමයෙක් හමුවුණ එකම මට අද ලොකු සතුටක්" ඔහුට කතාව වෙනතකට හරවන්නට අවශ්‍යව ඇති බව පෙනෙයි.

"අපි ඉස්කෝලෙ යන කාලෙ සාහිත්‍ය සංගමේ රැස්වීමෙදි අමරදේව මහත්තයගෙ සින්දු කිව්වා.. අපි කෙල්ලොත් සමහර වෙලාවට කිව්වෙ ඒ මහත්තයගෙ සින්දු.. ඒ නිසා තාමත් ඒවට ආසයි.. මහගමසේකර මහත්තයගෙ ඩෝල්ටන් අල්විස් මහත්තයගෙ වගෙ අයගෙ වචන වලින් ලියවුණ අදහස් වලට අපි තාමත් ආසයි.. අලුත් සින්දු එනවා .. යනවා.. ඒව හිත්වල රැඳෙන්නෙ නෑ.. හිස් වචන විතරයි සර්" ස්නේහා කී දීර්ඝ විස්තරය මේනක අසා සිටියේ පුදුමයෙනි.

"මතුපිටින් සරළ අහිංසක මෙළෝ හසරක් නැති කෙල්ලක් වගේ හිටියට අදහස් අතින් ස්නේහා ඉන්නෙ හරිම ඉස්සරහින්නෙ" ඔහු ඒ පුදුමය නොසඟවමින් කීවේ ය.

"ඒකෙ පුදුම වෙන්න දෙයක් නෑ සර්.. අපි ගමේ ගොඩේ හැදිච්ච කෙල්ලො.. අපේ සිතුම් පැතුම් නගරෙ අයට වඩා වෙනස් කියන එක මේ කොළඹ රස්සාව කළ අවුරුද්දට දෙකට මං තේරුම් අරගෙන ඉන්නෙ.. අපේ පරිසරයෙන් අපට දීල තියෙන්නෙ වෙනම ආකාරක වැලිව්ස්.. අපි අනුගමනය කරන දේවල්, අපි ආස කරන දේවල්, අපි අගය කරන දේවල් නගරයේ කෙල්ලන්ට වඩා හුඟක් වෙනස්.. අපේ අප්පච්චිල අම්මල අපට කියල දීල තියෙන දේ ගොඩක් තියෙනවා.. ඒ අය උදේ හවා බුදුන් වඳින අය.. මේ ලෝකෙ ජීවත් වෙන්න ඕනෙ හොඳ ක්‍රමය අපට කියලා දීලා තියෙනවා.. මේ ලෝකෙ අගය කරන්න ඕනෙ හොඳ දේ මොකක්ද නරක දේ මොකක්ද කියලා අපට කියලා දීලා තියෙනවා.." ස්නේහා කතාව මදක් නතර කර මේනක ගේ මුහුණ දෙස හැරී බැලුවේ ඔහු අසා සිටන්නේදැයි සැක හැර දැන ගන්නටය. ඔහු උනන්දුවෙන් අසා සිටින බව තහවුරු කරගත් පසු ඈ නැවත කතාව ඇරඹුවා ය. "...ඒ අය මහ උගත් මිනිස්සු නොවුණාට ජීවිත ගැන ඒ අයට තියෙන දැනුම උපාධිකාරයන් ළඟවත් නැහ සර්... ඒ දැනුම මේ මිනිස්සුන්ට තිබ්බ නම් අර වගේ රස්සාවල් ඉල්ල ඉල්ල පාරවල් ගානෙ පෙළපාලි යන්නෙ නැහැ.. ජීවිතේට ධෛර්යයෙන් මුහුණ දෙනවා මිසක්"

**මතු සම්බන්ධයි**



## ස්නේහාගේත් අකලංකගේත් කතාව

> **අද මං නිවාඩුවක් ගත්තා ස්නේහා... හවස් වෙද්දි මහන්සියක් වගේ දැනුණා.. ටිකක් වෙනසකටත් එක්ක නුගේගොඩින් බැස්සෙ.. මං හිතුවෙ නෑ ඔයා මෙතෙනදි හමුවෙයි කියලා**

